# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2182/4 - 2020 ජුනි මස 29 වැනි සඳුදා - 2020.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/AKU/4/2/1/39.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/128.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 590 දරන රඹුකේ ඇල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රඹුකේ ඇල ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස්කර අනුමත කරන ලද, 2020.02.24 වැනි දිනැති අංක මහ 6976 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 හා කැබලි අංක 2 වශයෙන් දැක්වෙන, අංකුඹුර වතුයාය නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0328 (පර්චස් 13) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක :

**කැබලි අංක 1-** ඉඩමේ නම: අංකුඹුර වතුයාය; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: එම්. වයි. එම්. නවුෂාඩ් මහතා, අංක 209/බී, රඹුකේ ඇල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0114 (පර්චස් 4.5).

ඉඩමේ මායිම් :

උතුරට: එම්. වයි. නවුෂාඩ් හිමිකම් කියන අංකුඹුර වතුයාය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ එම්. එච්. එම්. නවුෂාඩ් හිමිකම් කියන අංකුඹුර වතුයාය; දකුණට: එම්. එච්. එම්. නවුෂාඩ් හිමිකම් කියන අංකුඹුර වතුයාය සහ එස්. එල්. එම්. සුබයිර් හිමිකම් කියන අංකුඹුරවතුයාය; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 2 සහ එම්. වයි. එම්. නවුෂාඩ් හිමිකම් කියන අංකුඹුර වතුයාය;

**කැබලි අංක 2-** ඉඩමේ නම: අංකුඹුර වතුයාය; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: එම්. වයි. නෂීම් මහතා, අංක 209/බී, රඹුකේ ඇල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0214 (පර්චස් 8.5).

ඉඩමේ මායිම් :

උතුරට: එම්. වයි. නවුෂාඩ් හිමිකම් කියන අංකුඹුර වතුයාය; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 1, එම්. එල්. එම්. සුබයිර් හිමිකම් කියන අංකුඹුර වතුයාය සහ මූලික පිඹුරු මහ 6532 හි

1A - G 32403 - 27 (2020/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

කැබලි අංක 1; දකුණට: මූලික පිඹුරු මහ 6532 හි කැබලි අංක 1 සහ එම්. වයි. නෂීම් හිමිකම් කියන අංකුඹුර වතුයාය; බටහිරට: එම්. වයි. නෂීම් හිමිකම් කියන අංකුඹුර වතුයාය සහ එම්. වයි. එම්. නවුෂාඩ් හිමිකම් කියන අංකුඹුර වතුයාය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින්, බලය ලත් අයවලුන් හෝ 2020 අගෝස්තු මස 14 වැනි දින පෙරවරු 9.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 අගෝස්තු මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2020 ජුනි මස 24 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 372

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/AKU/4/2/1/71.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2015/WS/125.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 586 දරන දිප්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිප්පිටිය ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2020.01.16 වැනි දිනැති අංක මහ 6959 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 වශයෙන් දැක්වෙන, සයින්ස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට් නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0379 (පර්චස් 15) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**කැබලි අංක** 1 - ඉඩමේ නම: සයින්ස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට්; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: එස්. එම්. එස්. නුරුල් අස්මියා මහත්මිය, අංක 98, උයන්වත්ත, දෙවනගල, මාවනැල්ල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0379 (පර්චස් 15).

ඉඩමේ මායිම් :

උතුරට: මූලික පිඹුරු අංක මහ 6810 හි කැබලි අංක 2, එස්. එම්. එස්. නුරුල් අස්මියා සහ තවත් අය හිමිකම් කියන සයින්ස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට්; නැගෙනහිරට: එස්. එම්. එස්. නුරුල් අස්මියා සහ තවත් අය හිමිකම් කියන සයින්ස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට්; දකුණට: එස්. එම්. එස්. නුරුල් අස්මියා සහ තවත් අය හිමිකම් කියන සයින්ස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට් සහ එම්. පී. අතුල ප්‍රියදර්ශන බණ්ඩාර හිමිකම් කියන සයින්ස්ටන් සීඩ් ඩිවිෂන් එස්ටේට්; බටහිරට: එම්. පී. අතුල ප්‍රියදර්ශන බණ්ඩාර හිමිකම් කියන සයින්ස්ට් සීඩ් ඩිවිෂන් එස්ටේට්, මූලික පිඹුරු අංක මහ 6942 හි කැබලි අංක 2 සහ කැබලි අංක 1 පාර සහ මූලික පිඹුරු අංක මහ 6810 හි කැබලි අංක 2.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින්, බලය ලත් අයවලුන් හෝ 2020 අගෝස්තු මස 13 වැනි දින ප. ව. 2.00 ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2020 අගෝස්තු මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳව ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2020 ජුනි මස 24 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 373

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.